ET/SSS/2022(2023)/OL/61/S/Q/S-1

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

Student Seminar Series

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

Geography

භූගෝල විද්‍යාව

Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa

The National e-learning Portal for The General Education

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

61	S	I, II

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය – උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

භූගෝල විද්‍යාව I, II
புவியியல் I, II
Geography I, II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

භූගෝල විද්‍යාව I

සැලකිය යුතුයි:

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40කින්** සමන්විත ය.
* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

I - පත්‍රය

- **අංක 1 සිට 6 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. වායුගෝලයේ .... හා ඔක්සිජන් ප්‍රතිශතය 99.04% ක් වේ.
(නයිට්‍රජන් / ආගන් / කාබන්ඩයොක්සයිඩ්)

2. සිලිකා හා මැග්නීසියම්වලින් පෘථිවියේ .... සමන්විත වේ.
(සාගරික කබොල / මහාද්වීපික කබොල / ප්‍රාවරණය)

3. ඩැනියුබ් ගංගාව .... මුහුදට ගලා බසියි. (මධ්‍යධරණී / කළු / කැස්පියන්)

4. .... දිස්ත්‍රික්කයේ සුළු අපනයන බෝගයක් ලෙස සාදික්කා වගා කරයි.
(බදුල්ල / මහනුවර / ගම්පහ)

5. ටින්, ක්‍රෝමියම් වැනි ඛනිජ ලබා ගැනීම .... පාෂාණ වල ප්‍රයෝජනයකි.
(ආග්නේය / අවසාදිත / විපරිත)

- **අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් “නි” යන්න වටා ද, වැරදි නම් “වැ” යන්න වටා ද රවුමක් අඳින්න.**

6. ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් වැඩි ම ප්‍රමාණයක් මිල දී ගන්නා රට ජපානය යි. නි /වැ
7. ශ්‍රී ලංකාවට ධනවත් සංචාරකයන්ගේ පැමිණීම මෑතක සිට වැඩි වී ඇත. නි /වැ
8. තේමා සිතියමක් යනු භෞතික හා සංස්කෘතික ලක්ෂණ ඇතුළත් වන සේ සකස් කරන ලද්දකි. නි /වැ
9. හිමාලය, අන්දීස්, රොකී ලෝකයේ ජන හීන ප්‍රදේශවලට නිදසුන් වේ. නි /වැ
10. පිලිපීන් දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගරයේ ඇති වන සුළි සුළං බැගියෝ නමින් හඳුන්වයි. නි /වැ

- **අංක 11 සිට 15 තෙක් හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. දකුණු ඇමරිකා මහාද්වීපයේ රටවල් අතරින් වැඩි ම ජන සංඛ්‍යාවක් වාසය කරන රට වන්නේ .... යි.
12. සමෝච්ච රේඛා ඉතාමත් ආසන්න ව පිහිටා තිබීම .... බෑවුමක විශේෂ ලක්ෂණය කි.
13. ලෝකයේ උසින් ම පිහිටා ඇති විල .... වේ.
14. මන්නාරම ආශ්‍රිත ව මෑතක දී ඉදි කළ සුළං බලාගාරය .... ලෙස හඳුන්වයි.
15. කිරි ගව සම්පත් හුවමාරු මධ්‍යස්ථානය .... ප්‍රදේශයේ පිහිටා ඇත.

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**



ඉහත ප්‍රස්තාරයට අනුව,

16. සංචාරක පැමිණීම ඉහළ ම අගයක් වාර්තා වී ඇත්තේ .... වර්ෂයේ දී ය.
17. අඩු ම සංචාරක පැමිණීම වාර්තා වන්නේ .... වර්ෂයේ දී ය.
18. සංචාරක පැමිණීම අඩු මට්ටමක සිට එකවර ම..............................වර්ෂයේ සිට වර්ධනය වී ඇත.
19. 2007 වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීම .... ක් පමණ වේ.

- **අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' හා 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුපිළිවෙළට 'ආ' තීරුවේ ඇති තොරතුරු සමඟ ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

අ	ආ
1. සුළු අපනයන බෝග	A. අගලවත්ත
2. වී	B. මහඉලුප්පල්ලම
3. කෘෂිකාර්මික බෝග	C. ගන්නෝරුව
	D. මාතලේ

1. ADB 2. BCA 3. CAB 4. DBC (..............)

21.

අ	ආ
1. ඕසෝන් වායුව	A. 0.03%
2. කාබන්ඩයොක්සයිඩ්	B. 0.93%
3. ආගන්	C. 0.00006%
	D. 0.45%

1. ABC 2. BDC 3. CAB 4. CAD (..............)

22.

අ	ආ
1. විසුවියස්	A. මාර්ටිනික් දූපත්
2. ක්‍රැකටෝවා	B. ඉන්දුනීසියාව
3. පේලි	C. අයිස්ලන්තය
	D. ඉතාලිය

1. ABD 2. BAD 3. CDA 4. DBA (..............)

23.

අ	ආ
1. වියළි කලාපයට සීමා වූ පසකි	A. රතු දුඹුරු පස
2. තෙත් හා වියළි කලාප දෙකෙහි පවතින පසකි	B. රතු දුඹුරු ලැටසොල් පස
3. තෙත් කලාපයට ආවේණික වූ පසකි	C. චූර්ණමය නොවූ දුඹුරු පස
	D. දියළු පස

1. ADB 2. BAC 3. CAB 4. DAB (..............)

24.

අ	ආ
1. මිසිසිපි මිසූරි ගඟ	A. ආක්ටික් සාගරය
2. යෙනිසි ගඟ	B. පැසිපික් සාගරය
3. හොවැංහෝ ගඟ	C. අත්ලන්තික් සාගරය
	D. ඉන්දියන් සාගරය

1. ACB 2. BAC 3. CAB 4. DAC (..............)

- **අංක 25 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

25. පහත A සිට E දක්වා ඇති තොරතුරු අතරින් වී වගාවේ දී වියළි කලාපයට අදාළ තොරතුරු දෙකක් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

   A. වැසි ජලය හා ජල සම්පාදනයෙන් වගාව සිදු කරයි
   B. ගංගා මිටියාවත් හා පහත් ප්‍රදේශවල වී වගාව සිදු කරයි
   C. කුඩා බිම් කට්ටිවල වී වගාව සිදු කරයි
   D. සහල් අතිරික්තයක් නිපදවයි
   E. හෙල්මළු ක්‍රමයට වී වගාව සිදු කරයි

   1. A හා B   2. A හා D   3. B හා C   4. D හා E   (..............)

26. 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල පරිමාණය දක්වා ඇත්තේ,

   1. ඉහළ වට තීරුවේ ය   2. මුහුණත තොරතුරු වල ය
   3. පහළ වට තීරුවේ ය   4. ඇතුළත මායිම් තීරුවේ ය   (..............)

27. ශ්‍රී ලංකාවේ වාසුළි වැසි ඇති වන කාලය වන්නේ ,

   1. අප්‍රේල් - මැයි   2. ජුනි - ජූලි
   3. ඔක්තෝබර් - දෙසැම්බර්   4. දෙසැම්බර් - පෙබරවාරි   (..............)

28. සංවර්ධනය මැනීමේ වර්තමාන මිනුමක් **නොවන්නේ,**

   1. දළ ජාතික නිෂ්පාදනය   2. ළදරු මරණ අනුපාතිකය
   3. සාක්ෂරතාව   4. උපතේ දී ආයු අපේක්ෂාව   (..............)

29. 1:50,000 පරිමාණයේ සිතියමක 14 cm ක් දිග මාර්ගයක සැබෑ දුර වන්නේ,

   1. 3.5 Km   2. 7 Km   3. 28 Km   4. 56 Km   (..............)

30. 2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තියට අනුව අඩු ම ජන සංඛ්‍යාවක් සහිත පළාත වන්නේ,

   1. ඌව   2. සබරගමුව   3. උතුරු මැද   4. උතුරු   (..............)

31. ශිලා ගෝලය සමන්විත වන ප්‍රධාන භූ තැටි ගණන වන්නේ,

   1. 03 කි   2. 05 කි   3. 06 කි   4. 07 කි   (..............)

32. ප්‍රාවරණය හා හරය වෙන් කරන අසන්තතිය හඳුන්වන්නේ,

   1. ගුටෙන්බර්ග්   2. මොහොරොවිසික්
   3. කොන්රඩ්   4. ලේමන්   (..............)

33. 2013 වර්ෂයේ දකුණු ආසියාතික රටවල සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය අඩු ම රට වන්නේ ,

1. ඉන්දියාව 2. ශ්‍රී ලංකාව 3. බංග්ලාදේශය 4. නේපාලය (.............)

34. මානුෂ සංවර්ධන දර්ශක අගය අනුව බෙදා දක්වා ඇති රටවල් කාණ්ඩ ගණන වන්නේ,

1. 03 කි 2. 04 කි 3. 05 කි 4. 06 කි (.............)

35. ලෝකයේ මුහුදු මට්ටමින් වඩාත් උසින් ම පිහිටා ඇති සානුව වන්නේ,

1. මොංගෝලියානු 2. ඩෙකෑන්
3. ටිබෙට් 4. පාමීර් (.............)

36. පෘථිවිය මත ඇති මිරිදිය ජල ප්‍රමාණයෙන් භූගත ජල ප්‍රතිශතය කොපමණ ද ?

1. 20 % 2. 38 % 3. 52 % 4. 79 % (.............)

- **පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. උන්නතාංශය
2. උෂ්ණත්වය

B - 1. තිරසර සංවර්ධනය
2. පරිසර සමතුලිතාව

C - 1. වනහරණය
2. නායයෑම්

D - 1. නාගරීකරණය
2. පරිසර දූෂණය

37. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නට හේතු වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද ?

1. A 2. B 3. C 4. D (.............)

38. දෙවැන්නේ ස්ථාවරය කෙරෙහි පළමුවැන්න බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය මින් කුමක් ද ?

1. A 2. B 3. C 4. D (.............)

39. දෙවැන්නේ අඩු වීම කෙරෙහි පළමුවැන්නේ වැඩි වීම හේතු වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද ?

1.A 2. B 3. C 4. D (.............)

40. පළමුවැන්නේ අවිධිමත් බව දෙවැන්නට හේතු වන බව දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද ?

1.A 2. B 3. C 4. D (.............)

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

61	S	I, II

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)

භූගෝල විද්‍යාව	I, II
புவியியல்	I, II
Geography	I, II

භූගෝල විද්‍යාව II

- ❖ මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- ❖ I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.එහි (අ),(ආ) සහ (ඉ) කොටස් **තුනට ම** පිළිතුරු සපයිය යුතු ය.
- ❖ II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතුයි.
- ❖ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

I - කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදා ගන්න.

i. A - B රේඛාවෙන් දැක්වෙන්නේ කුමක් ද ?
(නෙරුව / නිම්නය / මොහොර) (ලකුණු 01)

ii. C අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද ?
(දිය වළ / වැව / ජලාශය) (ලකුණු 01)

iii. අංක ① චතුරස්‍රයෙහි දැක්වෙන **භෝගය** කුමක් ද ?
(ගෙවතු වගාව / රබර් වගාව / වෙනත් වැවිලි) (ලකුණු 01)

iv. X සිට Y දක්වා මාර්ග කොටසේ දුර ආසන්න වශයෙන් කිලෝමීටර කීයද ?
(6 / 7 / 8) (ලකුණු 01)

v. E චතුරස්‍රය ඇති ප්‍රදේශයේ දක්නට ලැබෙන පොදු සේවා සැපයෙන ආයතන **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02)

vi. F, G, H යන ස්ථාන අතුරෙන් වඩාත් උසින් පිහිටි ස්ථානය කුමක් ද ? (ලකුණු 01)

- **සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ තුනක් පහත දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශය කියවා බලා නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

vii. A4 මාර්ගය වක්‍ර ව විහිදීමට හේතුව කඳු වැටියේ පිහිටීම යි. නි / වැ

viii. අංක ② න් දක්වා ඇති භූ විෂමතා ලක්ෂණය සානුවකි. නි / වැ

ix. සිතියමේ උතුරු අර්ධයේ වැඩි ජනාවාස ව්‍යාප්තියක් දක්නට ලැබේ. නි / වැ (ලකුණු 03)

(ඇ)



C
X
2
Y
H
1
E
G
F
B
A
Galgodagama
Araluvinna
Miriswel Gangoda
Welikatuwa
Iluklanda
Ellekona
Kuttiyagolla
Welegangoda
Gonathalawa
Galabada Arawa
Madugasmulla
Magandanoya Colony
Waralanda
Bulathwatta
Alupathgala
Magandana Oya
Obbegoda
Dunugollegama
Galabedda
Debedde Kivula
Dikthalawa
Maragalakanda Pahala
Therelagongoda
Magaskatuwa
Debeddekivula
OBBEGODAKANDA
Ambalanda
Lekasiswatta
Obbegoda
Medilla
Madukotan
Weliyaya Part
Karamada
Kammalekatuwa
Pahala Lekasiswatta
Sripana
Kimbulawelagama
Kimbulawela
Liyangolla
Monerakelewatta
Kimbulawela
MONARAGALA
1703.8
32 Liyangolla
Kalulandeyaya
Elapotha
Rattanapitiya
Sirigala
UPPUKOTA
Gangoda Arawa
Welyaya
Beraliyapola
Weliyaya
Weliwattaroda
Kivulelanda
Hemakandapitiya
Sirigala Part
Bulugollan Arawa
Magandanamulla
Samimalewatta
Monaragala
Maragalawatta
Pinnagolla
Rakshawatta
Pottuvil Road
Aliyawatta
Bandara Wadiya
Kolongolla
MARAGALAKANDA
Galgediyaya
Siriwijayapura
Hulandawa
Thissa Road
Monaragala Town
Kolonwinna
Welewatta
Patriyalanda
Wellawaya Road
MARAGALAKANDA
Abicut Road
Mahagangoda
Kachcheri Niwasa
Viharamulla
Kumaradolawatta
Kosgodakumbura
Viharamulla
Bibile Road Left Part
Aliyawatta
Kanahiththenna
Parawilawatta
Bus Depot
Butagolla
Kolonwinna
ARAKKERKADU
Endarulanda
Aluthwatta Part
Dorakada Arawa
Weliwatta
Berahana
Bohitiya
Muppane
Mahawela
Kudagoda
Dodamwatta
Kavudawagama
Dambepitiya
Kavudawa
Gangoda
Ganulpota
Palaruwa
Kavudawa

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.

- **අංක (i) සිට (v) දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.**

i. වට්නා යපස් කෙත් ඇති යුක්රේනය - A B C

ii. කොංගෝ වනාන්තරය - D E F

iii. ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය - G H I

iv. ආසියාවෙන් බැහැර ව වී වගා කරන මැඩගස්කරය - J K L

v. පිලිපීන දූපත් - M N O (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබද ව දක්වා ඇති තීරුව යොදා ගන්න.

- **අංක (i) සිට (v) දක්වා එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දැක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා, සිතියමට යාබද ව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.**

i. සුළු පොල් ත්‍රිකෝණයට අයත් මිද්දෙනිය - A B C

ii. පර්ල් මුතුපරය - D E F

iii. අඟුණකොලපැලැස්ස මාංශ බෝග පුහුණු මධ්‍යස්ථානය - G H I

iv. බෝගල මිනිරන් පතල - J K L

v. ආරුගම්බේ - M N O (ලකුණු 05)

(ආ)



(i)	
(ii)	
(iii)	
(iv)	
(v)	
	5

(ඉ)



(i)	
(ii)	
(iii)	
(iv)	
(v)	
	5

1. (අ) 10 (ආ) 5 (ඉ) 5 20

භූගෝල විද්‍යාව II

1 (අ)

I. --

II. --

III. --

IV. --

V. --

VI. --

VII. --

VIII. --

IX. --

X. --

II කොටස

2. පෘථිවියේ ජල චක්‍රය දැක්වෙන රූපසටහනක් පහත දැක්වේ.



i) රූප සටහනේ A හා B අක්ෂරවලින් දක්වා ඇති ක්‍රියාවලි දෙක පිළිවෙළින් නම් කරන්න.

(ලකුණු 2)

ii) ප්‍රධාන ජල මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 3)

iii) (a) ජලයේ ගුණාත්මකභාවය අඩු කිරීමට හේතු වන මානව ක්‍රියාකාරකම් තුනක් ලියන්න.

(b) ඉන් එකකින් සිදු වන බලපෑම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 5)

3. i) පහත සඳහන් වනාන්තර ලක්ෂණ සහිත වනාන්තර වර්ග දෙක නම් කරන්න.

A	B
- ස්තර කිහිපයක් පැවතීම	- ශාක කේතු රූපාකාර වේ.
- කොංගෝ ද්‍රෝණියේ දක්නට ලැබේ	- උතුරු ඇමරිකාවේ බටහිර වෙරළ ප්‍රදේශය
- කොටියා, රිලවුන් වැනි සතුන් දැකිය හැකි වීම	- ගෝනා, පිනිමුවා වැනි සතුන් දැකිය හැකි වීම

(ලකුණු 2)

ii) ජෛවගෝලයේ පැවැත්ම කෙරෙහි වනාන්තර වැදගත් වන්නේ කෙසේදැයි කරුණු තුනක් ඇසුරින් දක්වන්න.

(ලකුණු 3)

iii) වනාන්තර ශීඝ්‍රයෙන් අඩු වීම ජෛවගෝලයේ පැවැත්මට බලපාන ආකාරය කරුණු තුනක් මගින් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

4. i) මෙම රූප සටහනට අනුව A හා B ලෙස නම් කර ඇති සාගරික භූ ලක්ෂණ දෙක නම් කරන්න. (ලකුණු 2)



ii) පහත A, B, C වලට අයත් මුහුදු ප්‍රදේශ එක බැගින් නම් කරන්න.

A - සම්පූර්ණයෙන් ගොඩබිමෙන් වට වූ මුහුදු

B - අර්ධ වශයෙන් ගොඩබිමෙන් වට වූ මුහුදු

C - සාගරයට සම්බන්ධ ව සාගරයේ ම පිහිටි මුහුදු (ලකුණු 3)

iii) (a) උතුරු අක්ෂාංශ 23.5^0 හා දකුණු අක්ෂාංශ 23.5^0 අතර පිහිටි දේශගුණ කලාපය ද, දකුණු අක්ෂාංශ 23.5^0 හා දකුණු අක්ෂාංශ 66.5^0 අතර පිහිටි දේශගුණ කලාපය වෙන වෙන ම පිළිවෙළින් නම් කරන්න.

(b) ඔබ ඉහත (a) හි නම් කළ එක් දේශගුණික කලාපයක කැපී පෙනෙන ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

5.

i) ශ්‍රී ලංකාවේ තේ වගාවට හිතකර භෞතික සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii) වතු කෘෂිකර්මයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 3)

iii) වර්තමානයේ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය ආශ්‍රිත ව මතු ව ඇති ගැටලු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5)

6.

i) ශ්‍රී ලංකාවේ නියඟ ආපදාව බහුල ව දක්නට ලැබෙන දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii) නියඟ ආපදාව ඇති වීමට බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 3)

iii) (a) දේශගුණික වෙනස් වීම් අවම කිරීම පිළිබඳ අවධානය යොමු කරමින් පවත්වන ලද සමුළු දෙකක් නම් කරන්න.

(b) දේශගුණික වෙනස් වීම් අවම කිරීමට ජාතික වශයෙන් යෝජනා වී ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

(ලකුණු 2)

7.

i) පහත සිතියමෙහි A හා B ලෙස නම් කර ඇති ප්‍රධාන ජන සංකේන්ද්‍රණ කලාප දෙක නම් කරන්න.

(ලකුණු 2)



ii) ලෝකයේ අසම ජන ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් හා මානුෂ සාධකයක් වෙන වෙන ම නම් කරන්න. (ලකුණු 3)

iii) ලෝකයේ අධික ජන සංකේන්ද්‍රණ ආශ්‍රිත ව මතු වී ඇති ගැටලු තුනක් දක්වා , ඉන් එකක් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

8.

i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක එකලස් කිරීමේ කර්මාන්ත දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii) විද්‍යුත් උපකරණ හා විදුලි උපකරණ අතර වෙනස පැහැදිලි කර, උදාහරණය බැගින් දක්වන්න.

(ලකුණු 3)

iii) (a) එකලස් කිරීමේ කර්මාන්තය තුළ වර්තමානයේ දී දක්නට ලැබෙන ගැටලු තුනක් නම් කරන්න.

(b) ඉහත නම් කළ එක් ගැටලුවක් ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5)

*****